# දැන්වීමයි

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## ඒකාබද්ධ සේවයේ රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම

1.0 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේපවතින රියදුරු සේවයේIII වන ශ්‍රේණියේ තනතුරුවලපුරප්පාඩු සඳහා නිලධරයන් බඳවා ගැනීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරවඅයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 වෘත්තීය පරීක්ෂණය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පහත 8.0 වගුව මගින් දැක්වේ. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව, රියදුරු III, II,I හාවිශේෂ ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 3-2016රු. 25,790/- 10x270/- 10x300/-10x330/- 12x350/-රු.38,990/- වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිටය. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තව ද, ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

6.0 සියළුම නිලධාරීන් ස්ථානමාරු කිරීම් වලට යටත් වන අතර තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. **පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යෙන්ම සේවය කළ යුතුය.**කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

7.0 සුදුසුකම් :- රියදුරු සේවය III වන ශ්‍රේණියේතනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඇ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

(ඈ) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව සහිතව සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත්ව තිබීම.

(ඉ) වෘත්තීය සුදුසුකම් :

(i ) පෞද්ගලික / කුලී රථ හා තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබිම .

(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් සී සහ සී1 ) වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

(ii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය .

(ඊ) පළපුරුද්ද :

වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.(පළපුරුද්ද සහතිකමගින් සනාථ කළ යුතු ය .)

(උ ) කායික සුදුසුකම් :

අවම උස අඩි 05ක් විය යුතු ය.

දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර , මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කල යුතු ය .

(ඌ)රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේසේවයට පත් කරනුලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන දිනයේ** හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 **අයදුම්පත් කැඳවීම**

පහත වගුවේ සඳහන් පරිදි රියදුරු සේවයේ දක්වා ඇති තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුව | තනතුරු | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම්දෙපාර්තමේන්තුව | රියදුරු | 05 |

9.0 වෘත්තීය සම්මුඛ පරීක්ෂණය :-

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරික්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දී ම පැවැත්වෙන වෘත්තීය පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍ය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| විෂයයන් | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| (i) | රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| (ii) | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම | 40 | 20 |
| (iii) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

10.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරික්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහුරජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවනහා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

11.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ " **රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම** " යන්න සඳහන් කරන්න.

11.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරනක් දරණ නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම් අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.4 අයදුම්පත්‍ර යොමු කිරීම :

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.09.21වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම්දෙපාර්තුමේන්තුව ,
අංක 31,
පතිබා පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

12.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණයට හා වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරිම සඳහාපහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

- i පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්මේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
- ii වලංගු විදේශ ගමන් බලපත්‍රය
- iii වලංගු රියදුරු බලපත්‍රය

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග පරිදි

.............................................................................................

ඒ.එස්.ඉලන්ගමගේ
අධ්‍යක්ෂ ජනරාල්
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

2018 ...... මස ........ දින,
ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව,
අංක 31, පතිබා පාර, නාරාහේන්පිට, කොළඹ 05.